**සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනයේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023**

**------------------------------------------------------------------------------------**

සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන කර්මාන්තායතනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

කර්මාන්තායතනය විසින් අවසන් වරට පිළියෙල කර විගණනය කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්,බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| **වත්කම්** | |
| දේපළ පිරියත හා උපකරණ | 42,211,006 |
| දිගු කාලීන ලැබිය යුතු ශේෂ | 110,794,557 |
| ජංගම වත්කම් | 147,279,541 |
| **මුළු වත්කම්** | **300,285,104** |
| **බැරකම්** | |
| ජංගම බැරකම් | 83,806,919 |
| ජංගම නොවන බැරකම් | 1,661,688,916 |
| **මුළු බැරකම්** | **1,745,495,835** |
| ශුද්ධ වත්කම්/අයිතිය | (1,445,210,731) |
| මුළු බැරකම් හා හිමිකම | 300,285,104 |
| මුළු ආදායම | 11,702,140 |
| මුළු වියදම | 10,193,734 |
| **අතිරික්තය** | **1,508,406** |

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 8 කට අදාළ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | හිඟුරාන සීනි කර්මාන්තායතනය දැනට නාමිකව පවතින ආයතනයක් බැවින් 2016 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වර්ෂ 08 කට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලා මේ පිළිබඳව ඉදිරියේදී කටයුතු සිදු කරනු ඇත. | කර්මාන්තායතනය ඇවර කිරීමේ කටයුතු මේ දක්වා සිදුකර නොමැති බැවින් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1993 වර්ෂයේ පුද්ගලීකරණයට යටත්වූ මෙම ආයතනය අසාර්ථක වීම නිසා නැවත 1997 වර්ෂයේදී රජයට පවරාගෙන 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවූ බැවින් 2001 වර්ෂයේදී සියළු සේවකයන්ට වන්දි ගෙවා ඔවුන්ගේ සේවය අවසන් කර තිබුණු අතර මෙම කර්මාන්තායතනයට අයත් ඉඩම්වලින් කොටසක් සහ ගොඩනැගිලි අවුරුදු 30 ක බදු පදනම මත ලබාදී පුද්ගලික සමාගමක් පිහිටුවා තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 1,445 ක සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයක් මත මෙම ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිතව පවතී. | රු.මිලියන 1,445 ක සෘණ ශුද්ධ වත්කම් තත්ත්වයක් පෙන්නුම්කර ඇති මෙම ආයතනය මේ වන විට නාමිකව පවතින ආයතනයක් බවට පත්වී ඇති බැවින් 2019 අගෝස්තු 27 දිනැති අංක අමප/1972/117/058 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තායතනය ඇවර කිරීමට කටයුතු කළ අතර නමුත් වරින්වර අමාත්‍යාංශ වෙනස්වීම යටතේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු වී තිබුණත් ඇවර කිරීමේ කටයුතු විවිධ හේතුන් මත නිසියාකාරව සිදු වී නොමැති බැවින් නැවතත් අමාත්‍යාංශ වෙනස්වීමේදී මෙම ආයතනය මෙම අමාත්‍යාංශය යටතට අයත් වී ඇති නිසා මේ පිළිබඳ අධ්‍යයනය කර මෙම ඇවර කිරීමේ කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. | කර්මාන්තායතනයේ වත්කම් නිශ්කාශනය හා ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට නොපමාව පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවන මෙම කර්මාන්තායතනයේ 2015 වර්ෂය අවසානයට ශේෂ පත්‍රයේ දැක්වෙන පිරිවැය රු.මිලියන 42 ක් වූ ඉඩම්, ගොඩනැගිලි, වාහන, යන්ත්‍ර හා අනෙකුත් උපකරණ නිෂ්ක්‍රීයව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | මෙම නිෂ්ක්‍රීයව පවතින ඉඩම්, ගොඩනැගිලි, වාහන, යන්ත්‍ර හා අනෙකුත් උපකරණ කර්මාන්තායතනය ඇවර කරන අවස්ථාවේදී විධිමත්ව රජයේ නීති රීති හා රෙගුලාසිවලට අනුව අපහරණය කරනු ඇත. | වසර 20 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පවතින මෙම රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යෙදවීමට නොපමාව පියවර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)කර්මාන්තායතනයට අයත් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාළ කම්හල් ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත පුද්ගලික සමාගමක් වෙත 2007 වර්ෂයේදී ලබාදී තිබුණ ද 2009 මාර්තු 26 දිනැති අංක අමප 09/0398/329/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බදු ගිවිසුමක් පිළියෙල කොට ඒ සඳහා නීතිපති නිශ්කාශනය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුව ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විධිමත් බදු ගිවිසුමක් සකස් කර නීතිපති අනුමැතිය ලබාගැනීමට රේඛීය අමාත්‍යාංශය විසින් නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ)වසර 20 කට පමණ පෙර බදු ගිවිසුම් මගින් ගොවීන් 4493ක් අතර අක්කර 2.5 බැගින් අක්කර 11,232 ක් ලබාදී තිබුණද, ඒ සඳහා බදු මුදල් අයවී නොතිබුණු අතර එම බදු ගිවිසුම්වල කාලයද ඉකුත්වී තිබුණි. මෙම ඉඩම් ආපසු ලබා ගැනීමට හෝ අලුතින් බදු ගිවිසුම් අත්සන් කර බදු මුදල් අයකර ගැනීමට හෝ පුද්ගලික වැවිලි සමාගමට එම ඉඩම්වල ද පරිපාලනය පැවරීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුව ඇත. | ගොවීන් වෙත ලබාදී තිබූ කර්මාන්තායතනයේ ඉඩම් සඳහා බදු ගිවිසුම් සකස් කර බදු මුදල් අයකර ගැනීමට රේඛීය අමාත්‍යාංශය විසින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඇ)කර්මාන්තායතනය සතුව තිබෙන තොග හා අනිකුත් වත්කම් සම්බන්ධයෙන් වසර 20 කට අධික කාලයක සිට භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම 2022 වර්ෂයේදී එම කාර්යය සිදු කරන බව | ඉදිරියේදී කමිටුවක් පත්කර මෙම වත්කම්වල භෞතික සත්‍යාපනයක් සිදු කරනු ඇත. | භෞතික සත්‍යාපනයක් කර එම වත්කම්වල පැවැත්ම හා නිවැරදිතාවය තහවුරු කර ගැනීම හා එම වාර්තා විගණනය වෙත ලබාදීම නොපමාව සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| විගණකාධිපති වෙත දන්වා තිබුණද එම සත්‍යාපන වාර්තා මේ දක්වා විගණනය වෙත ලබා දී නොතිබුණි. | | |
| (ඈ)කර්මාන්තායතනයට අයත් නිල නිවාස 273 කින් නිවාස 91ක අනවසර පුද්ගලයින් පදිංචිවී සිටින අතර ඔවුන් ඉවත් කිරීමට නීතිමය කටයුතු කර නොතිබුණි. එසේම අනෙකුත් නිවාසවලින් කුලී මුදල් අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුව ඇත. | කර්මාන්තායතනයේ නිල නිවාසවල පදිංචි වී සිටින අනවසර පුද්ගලයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම හා විධිමත් කුලී ගිවිසුම් සකස් කර කුලී මුදල් අයකර ගැනීම රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතුය. |
| (ඉ)නාරාහේන්පිට කාර්යාලය තුළ බෝතල් නිෂ්පාදනාගාරයට අයත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, යතුරුපැදි 3 ක් හා මෝටර් රථයක්ද හිඟුරාන කම්හල් පරිශ්‍රයේ තිබෙන යන්ත්‍ර උපකරණ ඇතුළු වත්කම් ද 1997 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණු අතර එම වත්කම් අපහරණය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් අපහරණය කිරීම ඇවර කරන අවස්ථාවේදී විධිමත්ව රජයේ නීති රීති හා රෙගුලාසිවලට අනුව කටයුතු කරනු ඇත. | වසර 20 කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පවතින මෙම වත්කම් අපහරණය කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඊ)කර්මාන්තායතනයේ පවතින සියලුම වත්කම් පිළිබඳව රජයේ තක්සේරු වාර්තා ලබාගන්නා ලෙස 2018 පෙබරවාරි 27 දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් හිටපු සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දී තිබුණ ද එම තක්සේරු වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය. | ඉදිරියේදී මෙම කර්මාන්තායතනය ඇවර කරන අවස්ථාවේ දී රජයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන කටයුතු කරනු ඇත. | කර්මාන්තායතනයේ වත්කම් පිළිබඳ රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමේ කටයුතු නොපමාව සිදුකර විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (උ)2017 පෙබරවාරි මස පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණ හා 2019 අගෝස්තු 27 දිනැති අංක අමප/1972/117/058 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තායතනය ඇවර කිරීමටත් ඒ සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු බවටත් නියෝග හා අනුමැතිය ලබා දී තිබුණ ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කර අවසන් බව විගණකාධිපති වෙත දැන්වුවද මේ දක්වා එම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2019 අගෝස්තු 27 දිනැති අංක අමප/1972/117/058 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කර්මාන්තායතනය ඇවර කිරීමට කටයුතු කළ යුතු වුවත් වරින් වර අමාත්‍යාංශ වෙනස්වීම යටතේ මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම විවිධ හේතූන් මත නිසියාකාරව සිදු වී නොමැති බැවින් නැවතත් අමාත්‍ය මණ්ඩල සටහනක් හරහා එය බලාත්මක කර ඉදිරියේදී ඒ පිළිබඳ කටයුතු කරනු ඇත. | කර්මාන්තායතනයේ වත්කම් හා වගකීම් නිරවුල් කර ඇවර කිරීමේ කටයුතු වහාම අවසන් කළ යුතුය. |